**ඩිස්ටන්ස් ලර්නින් සෙන්ටර් ලිමිටඩ් - 2015**

**-------------------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඩිස්ටන්ස් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 සමාගම ස්ථාපිත කිරීම හා සමාගමේ හිමිකාරිත්වය

**-----------------------------------------------------------**

1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2001 නොවැම්බර් 01 දින සමාගම සංස්ථාපනය කරන ලද අතර එහි මෙහෙයුම් 2002 මාර්තු 26 දින ආරම්භ කරන ලදී. මෙය සම්පූර්ණයෙන් රජය සතු සමාගමක් වන අතර, භාණ්ඩාගාරයේ ලේකම් සමාගමේ තනි කොටස් හිමිකරු වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3.1 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් (කුමපඅ සඳහා ශ්‍රීලංමුවාප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

------------------------------------------------------------------------

2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියෙහි නියම කර ඇති පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

අ. මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

## 4. මූල්‍ය සමාලෝචනය

------------------------

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.6,546,415 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.3,329,049 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,217,366 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බහු මාධ්‍ය පහසුකම් වලින් ආදායම වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 5. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 5.1 සමාගමේ කාර්යසාධනය

-----------------------------

උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සහ දුරස්ථ ඉගෙනුම් වැඩසටහන් මඟින් දැනුම බෙදා ගැනීම, වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ ගෝලීය දුරස්ථ ඉගෙනුම් ජාලය භාවිතා කරමින් රාජ්‍ය හා පුද්ගලික අංශයට පහසුකම් සැලසීම සඳහා වෙනත් කාර්යයන් සංවිධානය කිරීම හා පැවැත්වීම, සේවකයන් පුහුණු කිරීම හා සංවර්ධනය සඳහා රාජ්‍ය ආයතනවලට අවශ්‍ය තාක්ෂණය, කළමනාකරණය සහ වෙනත් අන්දමේ සහාය සැපයීම, මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ හා වෙනත් වැඩසටහන්වල නිරතවන පුද්ගලයන් සඳහා ආධාර සහ ඩිප්ලෝමා, සහතික හා වෙනත් ප්‍රදාන, ප්‍රදානය කිරීම සමාගමේ ප්‍රධාන අරමුණු වේ.

මෙම අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i ප්‍රධාන අරමුණු පිළිබඳව භෞතික හා මූල්‍ය ඉලක්කයන් දක්වමින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් සමාගමේ ප්‍රගතිය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය. 2015 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවක් පිළියෙල කර තිබුණද, අරමුණු සපුරා ගැනීම පිළිබඳව මතුකර දක්වා නොතිබුණි.

ii විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අයවැයගත ආදායම් ප්‍රකාශනය හා වෙනත් තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ඉලක්කගත ලාභය හා ඉටුකර ගැනීම් පහත දැක්වේ.

| **වර්ෂය** | **ඉලක්කය** | **තථ්‍ය** | **ඉලක්කයේ ප්‍රතිශතයක් ලෙස ඉටුකර ගැනීම** |
|---|---|---|---|
| | රු. | රු. | |
| 2015 | 7,994,394 | 5,429,794 | 67.9 |
| 2014 | 1,936,185 | 3,202,470 | 165.4 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉලක්කගත ලාභය සපුරා ගැනීමේදී සැලකිය යුතු අඩුවීමක් විගණනයේදී නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් | වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන් පිළිබඳ උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) අත්තිකාරම් | වර්ෂය ආරම්භයේදී සේවකයන්ට ලබාදී තිබූ අත්තිකාරම් ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි. |